**සංචාරක අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

**ලංසු කැඳවීම (IFB/PEL/2020/01)**

**පිරිස් බලපත්‍ර ලබාදීම සඳහා පූර්ණ සංවයංක්‍රීය විභාග පද්ධතියක් හඳුන්වාදී පවත්වාගෙන යාම**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් නිකුත් කරනු ලබන පිරිස් බලපත්‍ර සඳහා පවත්වන පරික්ෂණ පැවැත්වීම සඳහා පූර්ණ ස්වයංක්‍රීය විභාග පද්ධතියක් හඳුවන්වා දී විධිමත්ව පවත්වාගෙන යාමට අපේක්ෂා කරනු ලබන අතර ඒ සඳහා **ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණ (ICB)** ක්‍රියාපටිපාටියට අනුව සුදුසුකම්ලත්, නිපුනතාවයෙන් හෙබි, පිළිගත් සහ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් සහිත ස්ථාපිත ආයතන වෙතින් මුද්‍රාතැබූ ලංසු කැඳවනු ලැබේ.

මෙම යෝජිත පද්ධතියට පිරිස් බලපත් නිකුත්කිරීමේ සහ එයට අදාල සේවාවන්හි සියළු කළමණාකරන කටයුතු සඳහා පහසුකම් සැපයීමේ හැකියාව තිබිය යුතුය. අදාල පද්ධතිය, ගුවන්යානා පියාසර හෝ නඩත්තු පිරිස් බලපත්‍රයන් හි දත්ත වාර්තා කිරීම, ගුවන් ගමන් පාලන හා ගුවන්යානා පිටත්වීම් වැනි දත්ත වාර්තා කිරීම මෙන්ම ඒ හා සම්බන්ධ අනෙකුත් තාක්ෂණික දත්ත වාර්තා කිරීම සඳහා උචිත අන්දමින් සකස් විය යුතු අතර ඒ පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් නිකුත් කරන අංක IFB/PEL/2020/01 ලේඛණයෙන් නියම කර ඇත.

ලංසු සඳහා ඉල්ලුම් කිරීමට උනන්දුවන, ඉල්ලුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- දේශීය හෝ විදේශිය වශයෙන් පිළිගත් සමාගමක් වීම හා සමාන ව්‍යාපෘති හසුරවා තිබීම හා ඒ සම්බන්ධව ඇති පළපුරුද්ද
- පසුගිය වසර පහක (05) ක කාලය තුල අවම වශයෙන් මෙම පද්ධතිය හා සමාන පද්ධතීන් තුනක් (03) වත් අවම වශයෙන් හසුරුවා ඇති පළපුරුද්ද
- අදාල ආයතනය, සේවා කළමණාකරන පද්ධතියක් ස්ථාපිත කර, නඩත්තු කරමින් අඛණ්ඩව අවශ්‍යතා පරිදි වැඩිදියුණු කිරීම පිණිස සුදුකම් ලැබීම සඳහා වන ISO/IEC 20000-1:2011 හෝ ඉන් පසුව නිකුත් කරන ලද සහතික කරණ පිටපත හෝ එයට සමාන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

මෙම ලංසු කැඳවීමට අදාල ලංසු ලේඛණ සහ අයදුම්පත්‍ර 2020. 08. 17 දින සිට 2020.09.25 දින දක්වා කාර්යාල වේලාවන් තුල 1500 පැය දක්වා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ, පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශයෙන් නිකුත් කරනු ලබන අතර රුපියල් 1 500.00 (සහ බදු මුදල් ද ඇතුලත්ව) ක ආපසු නොගෙවනු ලබන ගාස්තු මුදලක් ගෙවීමෙන් එය ලබාගත හැකිය.

නිවැරදි ලෙස සම්පූරණ කල ලංසු, තාක්ෂණික හා මූල්‍ය ලෙස වෙන් වෙන් වශයෙන් යෝජනා දෙකක් වන පරිදි බලයලත් පුද්ගලයින්ගේ නිලමුද්‍රාව සහිතව අත්සන් තබා, මුද්‍රා තබන ලද කවරවල බහා අදාල කවරයේ වම් පස ඉහළ කෙළවරේ "තාක්ෂණික" සහ "මූල්‍ය" ලෙස සහ "පූර්ණ ස්වයංක්‍රීය විභාග පද්ධතියක් හඳුන්වාදී පවත්වාගෙන යාම" ලෙස සටහන් කොට ගෙනැවිත් භාරදීම හෝ පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීම සිදුකල හැකිය. එමෙන්ම සියළුම ලංසු අයදුම්පත් සමගින් රුපියල් 100 000.00 ක් වටිනා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කල මූල්‍ය ආයතනයකින් නිකුත් කල, ලංසු අවසන් වන දින සිට දින 90 ක කාලයක් දක්වා වලංගු වන් කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් බැගින් තැබිය යුතු වන අතර එය තාක්ෂණ යෝජනා සහිත කවරයේ බහා යොමුකල යුතුය.

ලංසු භාරගැනීම 2020. 09. 28 දින පස්වරු 2.30 ට අවසන් කෙරේ. ඒ සමගම ඉදිරිපත් කර ඇති ලංසු විවෘත කිරීමට කටයුතු කරනු ලබන අතර ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පූර්ව ලංසු කැදවීමේ රැස්වීමක් 2020. 09. 07 දින පෙරවරු 10 00 ට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ දී පැවැත්වේ.

ලංසුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ආයතනය විසින් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක් වූ, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය නමින් ලබාගත් කොන්දේසි විරහිත කාර්ය සාධන බැඳුම්කරයක් ලබා දිය යුතුය.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක